# වියනා කවයේ හා විද්‍යාත්මක දර්ශනය පිළිබඳ බර්ලින් සමාජයේ අනුභූතිවාදය ආවර්ජනයන් හා සමීක්ෂාවන්

ගාමිණී හපුආරච්චි

## 1. අනුභූතිවාදී කණ්ඩායම් ද්වය පිළිබඳ මූලික සටහන්.

විද්‍යාත්මක උනන්දුවක් සහිත දාර්ශනිකයන්ගේ සහ දාර්ශනික උනන්දුවක් සහිත විද්‍යාඥයන්ගේ සාමූහික උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් පැන නැගී තාර්කික හෙවත් විද්‍යාත්මක අනුභූතිවාදයේ කේන්ද්‍රීය අදහස් විසිගනන්වල දී හා තිස්ගනන්වල දී වියනා හා බර්ලින් නගරවල වර්ධනය විය. භෞතික විද්‍යාවන් පරීක්ෂණ හා නිරීක්ෂණ අත්හදාබැලීම් වල ට යටත්වන සුළු වන අතර පාරභෞතික කියමන් එවැනි වාස්තවික, විවේචනාත්මක අගැයීම් කිසිවකට යටත් නොවන බව මෙම චින්තකයන් පෙන්වා දුන්නේ ය. තවද, මෙම භෞතික විද්‍යාවන්ගේ උපන්‍යාසයන් පිළිගැනීමට හෝ බැහැර කිරීමට හේතු විය හැකි අතර එමගින් එය වාස්තවික විද්‍යාත්මක ඥානයේ වර්ධනයට දායක වෙයි. එනමුත් පාරභෞතික ගැටලු හා කියමන් වාස්තවික අගැයීමට භාජනය නොවන අතර ඒවා නැවත නැවත පැනනගියි.

වියනා කවයේ පුරෝගාමී මොරිට්ස් ශ්ලික්[2] විසින් මෙම තත්ත්වය සම්බන්ධයෙන් ඔහුගේ, 'දාර්ශනික ලෝකය[3]' නම් ලිපියෙන් විග්‍රහ කරනු ලැබූ අතර එය 1930 වර්ෂයේ දී 'දැනුම'[4] නම් වාරසඟරාවේ පළ විය. දාර්ශනික මතවාදයන් හී අරාජික ස්වරූපය බැහැර කරමින් ඔහු අභිමානයෙන් යුක්තව මෙසේ පැවසුවේය. "දර්ශනය විෂයෙහි නියත හැරවුමක, එනම් දාර්ශනික මතවාදයන් හි අරුත් සුන් කලහය අවසන් කරන හැරවුමක, මධ්‍යයෙහි අපි සිටිමු." එවැනි සියලු අරුත්සුන් කළහයත් අවසන් කිරීම ඔහු ශුද්ධ විද්‍යාවන් හී අන්තර්ගත පැහැදිලි හා නියත චින්තනයෙන් ද රූපික හෙවත් සංකේත තර්ක ශාස්ත්‍රයේ මූලධර්මයන්ගෙන් ද දුටුවේය.

පුලුල් වශයෙන් සාකච්ඡා කිරීමේ දී, පාරභෞතිකවාදය සමන්විත වන ගැටලු සැබෑ ගැටලු නොවන බව ද උචිත සංකල්පීය හා භාෂාමය උපකරණ යොදා ගනිමින් විමර්ශනය කිරීමේ දී පාරභෞතික ගැටලු සූත්‍රගත කිරීමට පවා නොහැකි බව ද ඒවා පැහැදිළි අර්ථයන් නොමැති ව්‍යාජ ගැටලු යන ස්ථාවරය වියනා කවය දැරුවේය.

තාර්කික අනුභූතිවාදීන්ගෙන් සමහරෙකු - විශේෂයෙන් ම නියුරාත් හා කානප්[5]- පාරභෞතික සංවාදයක් දේශපාලන හා ආගමික වශයෙන් අවභාවිතය කිරීමේ හැකියාව පවා පවතින බව පෙන්වා දුන්නේය. කානප් ඔහුගේ ඉහළ තාක්ෂණික කෘතියක් වූ 'ලෝකයේ තාර්කික ව්‍යුහය'[6] හී පෙරවදනෙහි, දාර්ශනික ක්ෂේත්‍රයේ දැනට සිදුවන විප්ලවය පුලුල් සංස්කෘතික සන්දර්භයකට ගලපමින් කෙටි නමුත් අගනා සටහනක් යෙදුවේය.

"අපගේ දාර්ශනික කාර්යයෙහි ගැඹුරු ආකල්පය හා වර්තමානයේ දැකිය හැකි එයට හාත්පසින් ම වෙනස් ක්ෂේත්‍රයක් වන කලාව, විශේෂයෙන් ම ගෘහනිර්මාණ කලාව හා මානව ජීවිතයට අර්ථාන්විත හැඩයක් ලබා දෙන ව්‍යාපාරයන් හි අධ්‍යාත්මික ආකල්ප අතර අභ්‍යන්තර සම්බන්ධතාවක් දැකිය හැකිය."

මෙහි ලා බවුහවුස්[7] විසින් වර්ධනය කරනු ලැබූ අදහස් කෙරෙහි කානප් සජීවී උනන්දුවක් පල කළේය. ඔහු 'සැලසුම්කරණ චිකාගෝ විද්‍යාතනයේ'[8] (නියුරාත් හා ෆීගල්[9] මෙන්) දේශන පැවැත් වූ අතර එල්. මොහොලි-නැගි[10] සමග අදහස් හුවමාරු කරගත්තේ ය.

සම්ප්‍රදායික දර්ශනයෙන් රැඩිකල්වාදී ආකාරයෙන් බිඳී යාම දැඩි ව අවධාරණය නොවුව ද තාර්කික අනුභූතිවාදී කණ්ඩායමක් නව දාර්ශනික ව්‍යාපෘතියක් වශයෙන් බර්ලින් නගරයෙන් ද පැන නැග්ගේය. මෙම නව හැරවුම රයිකන්බාක්ගේ[11] 'විද්‍යාත්මක දර්ශනයේ නැගීම' නම් ග්‍රන්ථයේ සටහන් වෙයි. සමකාලීන තාර්කික විශ්ලේෂණ ක්‍රමවේදය විස්තර කරන සහ "දර්ශනය සාවද්‍ය මාර්ගයකින් නිරවද්‍ය මාර්ගයකට අවතීරණය වීමේ ශාක්ෂි ඇතැයි" පවසන මෙම ග්‍රන්ථයෙහි පළමු කොටස පැරණි 'දාර්ශනික සමපේක්ෂණයයේ' දුර්වලතා අවධාරණය කරන අතර දෙවන කොටස නව විද්‍යාත්මක දර්ශනය අවධාරණය කරන බව ඔහු පැවසුවේ ය.

## 2. බර්ලින් අනුභූතිවාදී කණ්ඩායයම

දැන් මට බර්ලිනයේ හා වියනාවේ, මෙම කණ්ඩායම් දෙක ම විසින් ඉතා ළඟින් ඇසුරු කරන ලදි, විශ්ලේෂීඅනුභූතිවාදී කණ්ඩායම් පිළිබඳ වඩා විශේෂිත හා වඩා පෞද්ගලික නිරීක්ෂණ ඉදිරිපත් කිරිමට ඉඩ දෙන්න.

මට පෞද්ගලිකව මුනු ගැසුනු පළමු අනුභූතිවාදියා හැන්ස් රයිකන්බාක් ය. ඔහු 1926 වර්ෂයේ දී, දාර්ශනිකයන්ගේ ප්‍රබල විරෝධතා මධ්‍යයේ ද විද්‍යාඥයන්ගේ, විශේෂයෙන් ම අයින්ස්ටයින් හා ප්ලෑන්ක්ගේ[12] ප්‍රබල සහයෝගය මධ්‍යයේ ද, බර්ලින් විශ්වවිද්‍යාලයට (භෞතික විද්‍යා පීඨයට)[13] පැමිණියේය. එකළ මම ගෝටින්ගන් හා හයිඩල්බර්ග්[14] හී අධ්‍යයනය කර බර්ලිනයේ එක් වර්ෂයක අධ්‍යයන කටයුතු වල නිරත ව සිටියෙමි.

මා රයිකන්බාක්ගෙන් පාඨමාලාවක් අධ්‍යයන කළ අතර 'හේතුත්වය හා නියතිවාදය'[15] පිළිබඳ ඔහුගේ අදහස්වලින් තිගැස්සි ගියෙමි. ඒවා මා මෙයට පෙර උගත් මතවාදවලින්, විශේෂයෙන් ම කාන්ට්ගේ 'ශුද්ධ විචාර පරීක්ෂාවේ'[16] අදහස් වලට වඩා සපුරා ම වෙනස් විය. හේතුත්වය පිළිබඳ සිද්ධාන්තය සැබෑ ප්‍රාගානුභූතියක් වශයෙන් මා සලකන බව මම රයිකන්බාක් ට පැවසුවෙමි. තමන්ට ම ආවේනික මද සිනහවක් පෑ ඔහු කෙනෙකුගේ මෙනෙහි කිරීමේ ශක්තිය කොපමණ පටු විය හැකි දැයි පවසමින් මා කාන්ට්ගේ ඇඩ ද යොත ද බරුව ද එකවිට ගිලදමා ඇතැයි පැවසුවේ ය. කෙසේ නමුත්, ඒ ගැන කලබල නොවන ලෙස ද ඔහුගේ තර්ක වලින් මාගේ මනස ආලෝකමත් වනු ඇතැයි ද

පැවසුවේ ය. ඇත්තවශයෙන් ම එම විෂය කරුණ ගැන ද තවද බොහෝ කරුණු ගැන ද මාගේ මනස වෙනස් විය. දාර්ශනික ගැටළු පිළිබඳ රයිකන්බාක්ගේ විමර්ශන සියල්ල මා නොපිළිගත්ත ද එය මා අනුභූතිවාදයේ දෝතට රැගෙන ගියේය.

රයිකන්බාක්, ඔහුගේ අදහස් ආත්මවිශ්වාසයකින් ඉදිරිපත් කළ අතර සමහර තැනක ප්‍රතිවිරුද්ධ අදහස් හිතුවක්කාරී ලෙස ප්‍රතික්ෂේප කළේය. එසේනමුත් එය, ගුරුවරයෙකු වශයෙන් පැවති ඔහුගේ දක්ෂතාවයට ද ශිෂ්‍යයන් සමග සම්බන්ධතා පැවැත් වූ නැවුම් හා නිදහස් ආකාරයට ද බාධාවක් නොවී ය. එවකට බටහිර යුරෝපයේ ශාස්ත්‍රඥයන් නවක ශිෂ්‍යයන් සමග පැවැත් වූ සම්ප්‍රදායික දුරස්ථ හා මහේශාක්‍ය ලීලාවට වඩා සැහැල්ලු ලෙස ඔහු ගනුදෙනු කළේය.

වරෙක මා මැක්ස් ප්ලෑන්ක් පසුපස දිවයමින් ඔහුගේ දේශනයෙන් පැන නැඟී ගැටළුවක් විමසුවෙමි. "මගේ සහයකයාගෙන් අසන්න" යනුවෙන් පවසමින් ඔහු කාර්යාලයට රිංගා ගත්තේ මා දෙස හැරී බැලීමකින් පවා තොරවය. එය රළුබවක් හෝ ගනන් නොගැනීමක් වශයෙන් හෝ නොසැලකිය යුතු අතර එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීම මහාචාර්යවරුන්ගේ සිරිත නොවීය.

රයිකන්බාක්ගේ දේශන මාගේ වෙනත් බොහෝ ගුරුවරුන්ගේ, ගෝටින්ගන් හී ගණිතඥ පෝල් බර්නයස්, බර්ලින් හී මනෝවිද්‍යාඥ වොල්ෆාන්ග් කොලර් හා කර්ට් ලෙවීන්[17] මේ දෙදෙනාට ම ක්‍රමවේද පිළිබඳ උනන්දුවක් විය සහ වියනා කවයේ බොහෝ සාමාජිකයන්ගේ දේශනවලට වඩා ප්‍රියජනක විය. වැදගත් ගැටලු විසඳීමට, සමහරවිට ක්ෂෙත්‍රයට වැදගත් දායකත්වයක් සිදුකිරීමට පවා ස්වකීය ශිෂ්‍යයන් සාමූහිකව සම්බන්ධ කරගැනීමේ ප්‍රසන්න හැකියාවක් රයිකන්බාක්ට විය. ඔහු තම ශිෂ්‍යයන්ට ඉදිරිපත් කළ සමහර ගැටලුවලට විසඳුම් ඔහු වෙත නොපැවති බව ස්ථිර ය; එය ම එහි බුද්ධිමය ප්‍රබෝධය තීව්‍ර කිරීමේ ලා හේතු විය.

රයිකන්බාක් තව ශිෂයයන් සමග පැවැත්වූ සබඳතාවය පංතිකාමරයට සීමා නොවිය. ශිෂ්‍යයන්ගේ පෞද්ගලික ප්‍රශ්න විසඳීමට පවා ප්‍රයත්න දැරූ අතර බර්ලින් ප්‍රදේශය අවට විල් හා කැලෑ අසබඩ ඇවිදීමට ඔවුන් හා එක් වුයේය.

බර්ලින් විශ්ලේෂ - අනුභූතික කණ්ඩායමේ විද්වත් වෘත්තික සංවිධානය 'අනුභූතික දර්ශන සංගමය'[18] නම් විය. කුඩා සාකච්ඡා කණ්ඩායමක් වූ වියනා කවයට වඩා වෙනස්ව සංගමයේ සාමාජිකත්වය ලැබීමක් නොවීය. රයිකන්බාක් එහි නායකත්වය දැරූ අතර තාක්ෂණ විද්‍යාලයේ[19] දර්ශනය හා තර්ක ශාස්ත්‍රය ඉගැන්වූ වෝල්ටර් ඩුබිස්ලාව්, මනෝවෛද්‍ය ඇලක්සන්ඩර් හර්ස්බර්ග් හා දක්ෂ ගණිතඥයෙකු හා දාර්ශනිකයෙකු වූ ද 'අනිර්දේශක විරුද්ධාභාශය'[20] සොයාගත් කර්ට් ග්‍රෙලිං[21] එහි වෙනත් සාමාජිකයන් විය.

බර්ලින් උසස් පාසලේ සෑම අධ්‍යයන් වර්ෂයකට එහි වෛද්‍ය විද්‍යාල රංග භූමියේ විවෘත දේශන මාලාවක් පවත්වන ලදි. දේශන සඳහා පුලුල් පරාසයක විහිදුනු පුලුල් විවිධත්වයක් සහිත ගැටලු හා ප්‍රවේශ තෝරා ගන්නා ලදී. සම්ප්‍රදායික දර්ශනයට නැඹුරු

වුවන් ද වියානා හා පොලන්ත ජාතික ක්‍රමවේදවාදීන් ද කානප්, ටාස්කි[22] හා නියුරාත් ද දේශකයන් අතර විය. කථිකයෝ තර්ක ශාස්ත්‍රය, ඥානවිභාගය භාෂා පදසටනය හා මනෝවිශ්ලේෂණය ආදී විවිධ ක්ෂෙත්‍ර ඔස්සේ ශ්‍රාවකයන් ඇමතුවෝය. මෙහිදී මට එක්තරා ශාස්ත්‍රීය වශයෙන් අසම්මත සිදුවීමක් සිහිපත් කළ හැක. හනුස්සෙන්[23] නම් පුද්ගලයා මනෝමය හාස්කම් කීපයක් ඉදිරිපත් කළේය. මෙම ඉදිරිපත් කිරීම කෙතරම් ජනප්‍රිය වී ද යත් රංග ශාලාව පිරී ඉතිරී යන ප්‍රමාණයේ ජනතාවක් ඒකරාශී වී සිටියහ. ආසන අතර සිටගෙන සිටි ජනතාවට රංග ශාලවෙන් පිට වී යන ලෙස ඉල්ලා සිටි ආකාරය ද නැතහොත් පොලීසිය කැඳවන බවට තර්ජනය කළ ආකාරය ද මට මතකය. අනුන්ගේ සිත් කියවීම හා සඟවන ලද වස්තූන් සොයා දීම ආදි හාස්කම් කීපයක්ම ඔහු ප්‍රදර්ශනය කළේය.

1929 වර්ෂයේ නොවැම්බරයේ දී විට්ගන්ස්ටයන්ගේ තාර්කික පරමාණුවාදය[24] ගැන කානප් සිදු කළ දේශනය ගැන මම මිත්‍ර ශිෂයෙකුට ලියා යැව්වෙමි. සාකච්ඡාව පැය හතරක් පුරා පැවති අතර එහි අවසාන පැය දෙක අසල පිහිටි කෝපි හලක පවත්වන ලදි. රැස්ව සිටි අය අතර රයිකන්බාක්, ඩුබිස්ලාව්, ග්‍රෙලිං, හෙන්රික් ස්කෝල්ස්[25] (ඔහු කීල්[26] සිට පැමිණියේ යයි මම සිතමි), කර්ට් ලෙවින් හා ඉතා මෘදු පුද්ගලයෙකු වූ පෝල් බර්නයිස් ද විය. සාකච්ඡාව කොපමණ උණුසුම් හා ඝෝෂාකාරී වී ද කිවහොත් අසල මේස වල සිටි පෙම්වතුන්ගේ ප්‍රේමයට ද බාධා විය.

සංගමය, වියනා හී පිහිටි එහි සහෝදර සංගමය, අර්නස්ට් මක් සංවිධානය[27] සමග එක්ව 'දැනුම' සඟරාව එළ කළේ ය. කානප් හා රයිකන්බාක් කර්තෘවරුන් විය. එහි පළමු කලාපයේ කානප්, ඩුබිස්ලාව් හා රයිකන්බාක්ගේ ලිපි ඇතුලත් විය. ෂ්ලීක්ගේ . 'දර්ශනය වෙනස්'[28] නම් ලිපිය ද මෙහි ඇතුලත් විය. මුල් ශුද්ධ විද්‍යාවන්ගේ ඥානවිභාගය පිළිබඳ ලිපි ද ජීව විද්‍යා ලිපි ද අර්වින්. එෆ්. ෆ්‍රවුන්ඩ්ලික්ගේ[29] තාරකා විද්‍යා ලිපි ද එළ විය. මේවා දාර්ශනික ක්ෂෙත්‍රයෙන් පරිබාහිර සුවිශේෂ විද්‍යා ක්ෂේත්‍ර වලට අදාළ විය.

දැනුම සඟරාව 1939 දී නාසි පාලනය විසින් නවතා දමනු ලැබූ අතර නැවත එළ වුයේ 1975 වර්ෂයේ දී ය.

## 3. වියානා කවය

වර්ෂය 1928 දී කානප්ගේ 'ලෝකයේ තාර්කික ව්‍යුහය' හා තාක්ෂණික වශයෙන් ලිහිල් පත්‍රිකාවක් වූ 'භාෂාව පිළිබඳ තාර්කික විශ්ලේෂණය මගින් පාරභෞතිකවාදය පරාජය කිරීම'[30] කියවන්නට අවස්ථාව ලැබුණි. 1929 දී ප්‍රාග් නගරයේ පැවති, තාර්කික අනුභූතිවාදයේ වර්ධනයේ සන්ධිස්ථානයක් වූ 'ශුද්ධි විද්‍යා ඥානය පිළිබඳ සම්මන්ත්‍රණයේ' දී [31] කානප් මට පෞද්ගලිකව මුණ ගැසුනු අතර එහි දී ඇති කරගත් සැලසුමක් අනුව ඉතා කැමැත්තෙන් ම වියනා හී වාරයක අධ්‍යාපනය ලැබීමට තීරණය කළෙමි. රයිකන්බාක් මගේ අදහස අනුමත කළ අතර ඔහු ෂ්ලීක් වෙත යොමු කළ හඳුන්වා දීමේ ලිපියකින් වියනා කවයේ සාකච්ඡාවන්ට සහභාගීවීමට මට අවස්ථාව සැලසුනි.

එම සාකච්ඡා මාලාවට සහභාගී වුවන් අතර ෂ්ලික්, කානප්, ඔටෝ නියුරත්, හැන්ස් හාන්, හර්බට් ෆයිගල්[32] හා ෆ්‍රෙඩ්රික් වෙයිස්මාන් මට විශේෂයෙන් සිහිපත් වෙයි. මාගේ මතකය පරිදි කාල් මෙන්ගර්, ෆිලික්ස් කවුෆ්මන් හා ප්‍රාග් විශ්වවිද්‍යාලයේ අයින්ස්ටයින්ගේ අනුප්‍රාප්තිකයා වූ ෆිලිප් ෆ්‍රෑන්ක් ද මෙම සාකච්ඡාවට සහභාගී විය.[33] කවයේ ප්‍රමුඛ සාමාජිකයින් අතර ස්වල්ප දෙනෙකු, බර්ලින් විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා ආචාර්ය උපාධිධාරියෙකු වූ ෂ්ලික්, ගණිතඥයන් වූ, හාන් හා මෙන්ජර් හා සමාජ විද්‍යාඥයෙකු වූ නියුරාත්, පුහුණු දාර්ශණිකයන් නොවීය. කාල් පොපර්[34] මේ කාලයේ වියනා නගරයේ රැඳී සිටිමින් කවයේ සාමාජිකයන් සමග සජීවී සබඳතාවන් පවත්වා ගත්තේ ය.

කෙසේනමුත් ඔහු කවයෙන්, එහි සාමාජිකයන් අතර කැප වූ පක්‍ෂ මතවාදයක් නොවුව ද, නිශ්චිත දාර්ශනික දුරස්ථබාවයක්, එය සෑහෙන දුරස්ථබාවයක් බව මම සිතමි. පවත්වා ගත්තේය. මෙම චින්තකයන් බෙදා ගත්තේ, දර්ශනයේ ස්වභාවික විද්‍යාවන්ට වඩා වෙනස්ව ඉතා ගැඹුරු හා වැදගත් යයි සලකනු ලබන සමහර ගැටලු විසඳීමෙහි ලා ප්‍රදර්ශනය කළ අසාර්ථකත්වය පිළිබඳ අතෘප්තිය යි. මෙම ගාස් දාර්ශනික ගැටලු නූතන තර්ක ශාස්ත්‍රයේ පිටිවහල ලැබූ විශිෂ්ඨ විශ්ලේෂී ක්‍රමවේදය යොදා ගනිමින් එක්කෝ ඒවා විසදීම නැතහොත් ඒවා පදනම් විරහිත 'ව්‍යාජ ගැටලු' ලෙස පෙන්වා දීම තමන්ගේ කාර්යය වශයෙන් කවයේ සියලු සාමාජිකයින් සැලකුවේය. අවසාන වශයෙන් කවයේ සමස්ථ චින්තනය ඥානය පිළිබඳ අනුභූතිවාදී සංකල්පයෙන් පෝෂණය ලැබුවේ ය.

මේ අවස්ථාවේ ඇල්බට් අයින්ස්ටයින්, ඩේවිඩ් හිල්බර්ට්, අර්නස්ට් මක්. සිග්මන් ෆ්‍රොයිඩ්, ෆිලික්ස් ක්ලීන් හා ෂාක් ලොබ්[35] ආදී ශ්‍රේෂ්ඨ ගණිතඥයන්, විද්‍යාඥයන් හා විද්වතුන් රාශියක් විසින් වර්ෂ 1912 දී ප්‍රකාශයට පත්කරනු ලැබූ සමාන අනුභූතිවාදී උද්‍යෝගයක් සහිත 'ප්‍රකාශනය'[36] කෙරෙහි අවධානය යොමු කිරීමට මට ඉඩ දෙන්න.[37] ආනුභවික සිද්ධිවාචික අධ්‍යයනය පමණක් යොදා ගනිමින් ප්‍රායෝගික දැනීම රැස්කරන 'දාර්ශනික උනන්දුවක් සහිත සියලු පර්යේෂකයන්ට' , විද්‍යාඥයන්ට මෙන්ම දාර්ශනිකයන්ට ; යොමුකර තිබූ මෙම ප්‍රකාශනයෙන් ඔවුනට, සියලු විද්‍යාවන් අතර සජීවි සබඳතාවක් පවත්වා ගැනීමට හා පොදු තුලනාත්මක ලෝක දෘෂ්ටියක් පවත්වා ගැනීමට පිහිටුවාගත් 'යථානුභූතවාදී දාර්ශනික සමාජයට'[38] එක්වීමට ආරාධනා කර තිබුනි. දැන් වියනා කවය පිළිබඳ සලකා බපන්නේ නම් එහි සාමාජිකත්වය පොදුවේ අනුභූතිවාදී දෘෂ්ටියක් පවත්වාගන්නා අතර පාරභෞතිකවාදය බුද්ධිමය වශයෙන් අර්ථශූන්‍ය වශයෙන් සලකා ප්‍රතික්‍ෂප කළ නමුත් සමහර කරුනු වලදී වෙනස් මත දරමින් පෞරුෂයමය හා බුද්ධිමය වශයෙන් පැහැදිලි වෙනස්කම් පෙන්නුම් කළේය.

කානප් අන්තර්වර්තික, බුද්ධිවාදී හා අතිශය විධිමත් වූ අතර සමකාලීන සංකේත තර්ක ශාස්ත්‍රය පදනම් කරගත් තාර්කික විධික්‍රම භාවිත කරමින් දාර්ශනික ගැටලු පැහැදිලිව සූත්‍රගත කිරීමට උත්සහ කළේය. ඔහු තමන්ගේ අදහස්, කායිකවාදී විග්‍රහයන් ද ඇතුලුව, විද්‍යාත්මක භාවිතයන් ආශ්‍රයෙන් ගොඩනගාගත් පාරිභාෂික පද ආශ්‍රයෙන් සූත්‍රගත කළේය. 1930 ගනන්වලදී ඔහු කෝපය, සන්ත්‍රාසය, වෙහෙසකර බව හා කුසගින්න ආදී

මනෝවිද්‍යාත්මක තත්ත්වයන් මුලුමනින් ම කායිකවාදී පද වලින් විස්තර කළ හැකි සත්ත්ව චර්යාවන් වශයෙන් කායිකවාදී චින්තනයක් ඉදිරිපත් කළේය.[39] මෙම මතය ගිල්බට් රයිල්ගේ ඉතා වැදගත් හා බලපෑම්කාරී කෘතිය වන 'මනස පිළිබඳ සංකල්පය' (1945) හී අන්තර්ගත මනස පිළිබඳ සංකල්පය ගැන, සීමිත හා දළ වශයෙන් වුව ද පූර්ව අගැයීමක් විය.

දාර්ශනික ගැටලු විමසීමෙහි ලා කානප්ගේ විචක්‍ෂණ, විධිමත් හා ක්‍රමාණුකූල ක්‍රමවේදය සමහරුන් විසින් පණ්ඩිත්මානී හා ගම්භීර විමර්ශනයක් වශයෙන් සැලකීම පුදුමයක් නොවේ. විට්ගන්ස්ටයින්ගේ නිදහස් හා ප්‍රතිවේදාත්මක දාර්ශනික ශෛලියට වඩා මෙය මුලුමනින් ම වෙනස් ය. එකිනෙකට වෙනස් මෙම ශෛලීන් හේතුවෙන් ම වර්ෂ 1928 දී විට්ගන්ස්ටයින් කානප් සමග වූ සියලු දාර්ශනික බැඳීම්වලින් ඉවත් වූයේ ය.

වෙයිස්මාන්ගේ[41] දේශන හා සංවාද ශෛලීය කල්පනාකාරී හා විචක්ෂණශීලී ය. ශිෂ්‍යයන්ට තමන්ගේ ම චින්තනයක් ඇතිකරගන්නා ලෙස දැඩි ලෙස ඉල්ලා සිටිමින් ඔවුන් උත්තේජනය කළේය.

ෂ්ලික් ගම්භීර පෞරුෂයකින් හෙබි නමුත් නිසැකව ම කරුණාවන්ත හා ආචාරශීලි විය. නියුරත්ගේ බඳු තමන්ට නොපිළිගත හැකි අදහස් වලට පවා ඇහුම්කන් දුන්නේය.

ඔටෝ නියුරත් තරබාරු හා කෙලිලොල් අයෙකු විය. ඔහු ආත්මවිශ්වාසයක් සහිත අසීමිත ශක්තියකින් හෙබි නව අදහස් හා ව්‍යාපෘති නොඅඩු පුද්ගලයෙකු විය. ඔහු තම මිතුරන්ට යැවූ ලිපි වල අත්සන වශයෙන් යෙදුවේ සිනහසෙන හස්ථියෙකුගේ හැඩය ඇති තමාගේ ම රූපයයි. හස්ථි රුවෙහි 'O' අක්ෂරය ඇතුලත 'N' අක්ෂරය ඔහුගේ නමෙහි මුල් අකුරු-සටහන් කළ අතර හොඬවැලෙහි මල්පොකුරක් විය. නියුරත් ඔහුගේ දර්ශනය ඉදිරිපත් කළේ තාර්කික අනුකලනයට වඩා ක්‍රියාකාරී සැලසුමක් යෝජනා කරන සැහැල්ලු ශෛලියකිනි. සෑම සිදුවීමක් ම හා සෑම සංසිද්දියක් ම ශුද්ධ කායික විද්‍යා (හෝ භෞතික විද්‍යා) ක්‍රියාවලියක් වශයෙන් විස්තර කළ හැකිය. ඒවා කායිකවාදී භාෂාවකින් විස්තර කළ හැකිය. මෙය එක්තරා ආකාරයක කායිකවාදයකි; මෙයින් බැහැර වීම පදනම් විරහිත වන අතර සංදිග්ධතා ජනිත කරයි. මනෝවිද්‍යාවේ, සමාජවිද්‍යාවේ හා ඓතිහාසික අධ්‍යයනයන්ගේ අන්තර්ගත අභිලාශ, විශ්වාස, භීතිකා, බලාපොරොත්තු හා සම්ප්‍රදාය යනාදිය කායික විද්‍යාත්මක නොවේ. මේවා නැවත විභාග කර කායිකවාදී භාෂාවකින් ප්‍රකාශ කළ යුතුය.

ඔහු තම ශ්‍රාවකයන්ගේ හා පාඨකයන්ගේ ආනුභවික තිරිඟු ඇටය පාරභෞතික තිරිඟු පොත්තෙන් වෙන් කිරීමට එක්වන ලෙස ආරාධනා කළේය. අර්ථශූන්‍ය වදන් බහුල වශයෙන් භාවිත කිරීමඅතහැර ඒ වෙනුවට කායිකවාදී ලෙස කථා කිරීමට දරුවන් පුහුණු කළ යුතු බව ද ඔහු පැවසුවේය.

## 4. විද්‍යාවේ ක්‍රමවේදය: ප්‍රතිමානික ද? විස්තරාත්මක ද?

නූරාත්ගේ අදහස් කාන්ප් විසින් ඉදිරිපත් කරනු ලැබූ තාර්කික අනුභූතිවාදයේ ප්‍රධාන ධාරාව සමග මූලික වශයෙන් එකඟ නොවූ බව එපමණ ප්‍රකට නොවූ කරුණකි. දළ වශයෙන් ගත් කළ කානප්ගේ ක්‍රමවිද්‍යාව නියම හා සම්මුති පිළිබඳ පද්ධතියකි. එහෙත් නියුරාත් සැලකූ පරිදි විද්‍යාවේ ක්‍රමවේදය ආනුභවික හා චර්යාව පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ ආශ්‍රිත විස්තරාත්මක අධ්‍යයනයකි. විද්‍යාත්මක උපන්‍යාසය හා පර්යේෂණ සාක්ෂි අතර තාර්කික සබඳතාවක් වෙනුවෙන් කානප් පෙනී සිටියේය. විශ්ලේෂණාත්මක අනුභූතිය වනාහී අර්ථවත් ආනුභවික සාකච්ඡාවක් සඳහා වන අවශ්‍යතාවයක්, නිර්දේශයක් හා ප්‍රතිමානයක් බව ද විද්‍යාඥයන් තමන්ගේ පර්යේෂණ සොයාගැනීම් සමග ගලපන ආකාරයට විස්තරාත්මක ප්‍රකාශනයක් නොවන බව ද කානප් ප්‍රකාශ කළේය. කානප් සහ පොපර් දෙදෙනා ම (පසුව දැකගත හැකි ආකාරයට නියුරත් එසේ නොකළේය) 'ස්වභාවිකවාදය' ප්‍රතික්ෂේප කළෝය. ඒ අනුව විද්‍යාවට අදාළ තාර්කික විශ්ලේෂණය, වාස්තවික මානව ක්‍රියාකාරකම් පිළිබඳ විද්‍යාත්මක විමර්ශනයේ යෙදෙන ජීව විද්‍යාව, මනෝවිද්‍යාව හා සමාජ විද්‍යාව යනාදී විෂයන්ට අදාළ නොවන බව ද ඔවුහු පැවසූහ. කෙසේනමුත් මනෝවිද්‍යාත්මක, ඓතිහාසික, දේශපාලන හා සමාජ සංසිද්ධීන්ට අදාළව සැබෑ විද්‍යාත්මක පරීක්ෂණ පවත්වා ඇති බව ද එමගින් විශ්ලේෂී- ආනුභවික ප්‍රමිතීන්ගෙන් විතැන් වූ චර්යාවන් කෙරෙහි ආලෝකයක් පතිත වූ බව ද ගෞරවයෙන් පිළිගත්හ.

වියානා කවයේ එක් සාමාජිකයෙකු, ඔටෝ නියුරත්, විද්‍යාවේ ක්‍රමවේදය තර්ක ශාස්ත්‍රීය පද මත පදනම් වූ බුද්ධිමය ආකෘතියකට යොමු කිරීමට තදින් ම විරුද්ධ වූයේය. ඔහු බලකර කියා සිටියේ චර්යා පිළිබඳ කායිකවාදී පර්යේෂණ සඳහා ද ප්‍රමාණවත් විද්‍යා විමර්ශන රාමුවක් ලබා දිය යුතු බවයි.

සෑම විද්‍යා පදයක ම හෝ ප්‍රකාශයක ම නියත අර්ථයක් ලබාදීමේ බුද්ධිවාදී ප්‍රතිසංවිධානය පිළිබඳ කානප්ගේ මතවාදයට නියුරාත් විරුද්ධ වූයේය. නිදර්ශනයක් වශයෙන් විද්‍යාත්මක න්‍යායක වුව ද එහි ඇතුලත් සෑම පදයක ම නියත අර්ථයක් ලබා දෙන්නේ කෙසේ ද? එවැන්නක වුව ද වර්තමානයේ භාවිතනොවන, දැනට පවතින භාෂමය පද ඇතුලත් විය හැකිය. නියුරාත් අවධාරණය කර දක්වන්නේ, ශුද්ධ භෞතික විද්‍යාවේ බඳු නියත අර්ථ සහිත පද ද සාමාන්‍ය ව්‍යවහාරයේ බඳු සංදිග්ධ පද ද අර්ධ වශයෙන් ඇතුලත් 'විශ්ව පොදු ව්‍යවහාරයකි.'

එදිනෙදා වහරේ ඇතුලත් මෙම සංදිග්ධ පද හැඳීන්වීම සඳහා ඔහු 'සපත්තු අඩි ගෝෂාව'[42] යන පදය භාවිතා කළේය. කිසියම් විමර්ශනයක හෝ අභ්‍යුපගමන පද්ධතියක මුල් අවස්ථාවේ මෙය වැළැක්විය නොහැක.

උපයෝගිතාවාදී පදවල පුනුරුක්තිය[43] කෙරෙහි ද නියුරාත් අවධානය යොමු කළේය. උදාහරණ වශයෙන් කාල්ට දෙනු ලබන පනත් නියෝග දෙක සැලකිල්ලට ගන්න.

1) ධජය වැනුවහොත් පිටතට යන්න.

2) ධජය වැනුවහොත් පිටතට යන්න හා 2X2 = 4
මෙහි 2X2= 4 පුනුරුක්තියකි. එහෙත් එමගින් නියෝගයට බපලපැමක් නැත.

මේ ආකාරයට පුනුරුක්ති සඳහා උපයෝගීතාවාදී අර්ථකතන සැපයීම ප්‍රබල ගැටලු ඇතිකරන ප්‍රශ්නයකි. මා මෙය දක්වන්නේ තර්ක ශාස්ත්‍ර හා අංකගණිතමය ප්‍රකාශන සමග චර්යාවාදී - උපයෝගීතාවාදී එකිනෙකට සම්බන්ධ කරමින් එයට විද්‍යාත්මක වටිනාකමක් ඉල්ලා සිටිමේ නියුරාත්ගේ රළු ප්‍රයත්නය පැහැදිළිවම ගැටලු ඇති කරනවන බව පෙන්වීමට යි.

නියුරාත්ගේ විද්‍යාත්මක ක්‍රමවේදය මා දැක්වූ ආකාරයේ සරළ නිදර්ශනයට සීමා වෙයි. එහෙත්, මට වැටහෙන ආකාරයට ඔහු, විද්‍යාත්මක ක්‍රමවේදයේ සුලබ පහත ආකාරයේ පුලුල් හා තාක්‍ෂණික ගැටලුවලට පිළිතුරු ලබා නොදුන්නේය. එනම්: විද්‍යාඥයෙකු කිසියම් ප්‍රකාශනයක් හෝ න්‍යායක් පිළිගන්නේ කවර කොන්දේසි යටතේ ද? එනම්, සංසිද්ධියට අදාළ එකිනෙකට වෙනස් න්‍යාය දෙකක් ඇති කල්හී පවතින තත්වය යටතේ කවර න්‍යායක් පිළිගනු ලබන්නේ ද? සී. එස්. පියර්ස්, විලියම් ජේම්ස්, ජෝන් ඩිවී, අර්නස්ට් නාජල් ආදී පටු චින්තකයන් චර්යාවාදි නොව උපයෝගීතාවාදී දෘෂ්ටියකින් මේ ආකාරයේ ප්‍රශ්න කෙරෙහි සැලකිලිමත් වී තිබේ. ඩිවීගේ එක් ග්‍රන්ථයක් නම් කර ඇත්තේ, “අප සිතන්නේ කෙසේද? බුද්ධිවාදීව නම් නොවේ”[45] යනුවෙනි.

ඔටෝ නියුරාත් වියනා කවය පැවති මුල් අවධියේ ම පුරෝගාමී ක්‍රමවේදී උපයෝගිතාවාදියෙකු වුයේය. විද්‍යාත්මක විමර්ශන අවබෝධ කරගැනීමෙහි ලා උපයෝගිතාවාදය අවශ්‍ය බව දූන් අපි දනිමු.

ස්වභාවිකවාදී විරෝධී, මුල්කාලීන විද්‍යා ක්‍රමවේදියෙකු වශයෙන් තෝමස් කුන්ගේ[46] ඓතිහාසික, සමාජීය විද්‍යා හා මනෝවිද්‍යා ප්‍රවේශය-එය උපයෝගීතාවාදීය මා සිත තදින් පැහැර ගත්තේය.

මෙසේ වියනා කවය තුල මෙන් ම එයින් බාහිර විවේචනයන් ද හේතුවෙන් වියනා කවයේ අනුභූතිවාදය ක්‍රමයෙන් ලිහිල් වූයේය. අනුභූතිවාදයේ මතවාද දෙකක් හා ‘වචනය හා වස්තුව’ යන ග්‍රන්ථ මගින් අනුභූතිවාදය බැහැර කළ ඩබ්. වී. ක්වීන් මේ අතරින් කැපී පෙනෙයි.[47]

මෙම තීරණාත්මක වර්ධනයේ දී නියත පදනමක් සහිත ආනුභවික දත්තයන්ට අදාල මුල් සංකල්පය වෙනුවට ආසන්න නිරීක්‍ෂණයෙන් ගම්‍ය කරගත් හා එයට අනියම් ලෙස සම්බන්ධ, මේවා එකිනෙකට සහය පල කරන නමුත් කවර හෝ මොහොතක වෙනස්වීමට ද ඉඩ තිබේ, පද්ධති පිළිබඳ අනුසන්ධානවාදී හෙවත් සමස්ථ සංකල්පය විද්‍යාත්මක පිළිගැනීමක් ලබමින් ඉදිරියට පැමිණ ඇත.

පොපර් ඔහුගේ සුප්‍රකට උපමාවෙන් විස්තර කළේ, මාලිගය පිහිටි ගල මත නොව වගුරු බිමක නැගෙන කුළුණු මත ඉදිකර ඇතිබවයි. ගොඩනැගිල්ලට හානි නොවන තාක් එහි පදනම පිළිබඳ වැඩි අවධානයක් යොමු නොවේ. එනමුත් ගොඩනැගිල්ලේ පැලීම් මතු

වන විට එහි කුළුණු වගුරෙහි තව තවත් ගැඹුරෙහි ස්ථාපිත කර ගොඩනැගිල්ල ශක්තිමත් කිරීමට ප්‍රයත්න දරනු ලැබේ.

නියත තාර්කික පද යොදාගත් පරමාදර්ශී විද්‍යාත්මක භාෂාවක් පිළිබඳ කානප්ගේ අදහසෙහි ඇති ගැටලුකාරීත්වය පෙන්නුම් කිරීම සඳහා නියුරාත් වෙනත් උපමාවක් යොදාගත්තේය. දැනීම ගවේෂණයට අදාල අපගේ ප්‍රයත්නය වනාහි පල්ල සිදුරු වූ නෞකාවක් වරායකට රැගෙන විත් ශක්තිමත් ලෙස පිළියම් කිරීම වෙනුවට එය සාගරයෙහි පාවෙන අතර පිළියම් කිරීමට සදාකාලිකව උත්සහ කරන නැවියන් පිරිසකගේ ප්‍රයත්නයට සමානය.

ඩබ්. වී. ක්වීන් දූන් දශක තුනකට පසු තාර්කික අනුභූතිවාදය පිළිබඳ ඔහුගේ ඉතා ම බලපෑම්කාරී හා නිර්මාණාත්මක විවේචන සහිත 'වචනය හා වස්තුව' කෘතියෙහි, එය කානප් නමට පුද කරන ලදි, කේන්ද්‍රීය පාඨය ලෙස නියුරාත්ගේ උපමාව යොදා ගැනීම සැබවින්ම මට සුවිශේෂ ය.

වියානා කවයේ සමාරම්භක අදහස් එයට එරෙහි අභ්‍යන්තරව මෙන් ම බාහිරව ද එල්ල වූ විවේචන හා ප්‍රතිසංවිධානාත්මක අදහස් හේතුවෙන් විද්‍යාත්මක ඥානය හා විද්‍යා ගවේෂණයන්ට අදාළ ක්‍රමවේදය පිළිබඳ ඉතා නැවුම් හා ඉතා වෙනස් අනුභූතිවාදයක් දක්වා පරිණාමය වී තිබේ.

මෙම පරිණාමය තාවකාලික හෝ හුදෙක් බලාපොරොත්ත වලට පමණක් සීමා වූ හෝ වෙනස්වීමක් නොව වියනා කවයේ මුලික දර්ශනයෙහි, එනම් 'විද්‍යාත්මක ලෝක දෘෂ්ටයෙහි' සිදු වූ ස්ථිරසාර වෙනස් වීමකි. එහි ලෝක දෘෂ්ටිය ප්‍රාගානුභූති ඒකීය පද්ධතියක්[48] නොව විවේචනයට හා සංශෝධනයට භාජනය විය හැකි ලෝක දෘෂ්ටියකි.

## සමාප්තිය

අපගේ අවධනයට භාජනය වූ අනුභූතිවාදී කණ්ඩායම් දෙක ම ජාතික සමාජවාදී[49] පොලිස් වර්ධනය විසින් විනාශ කරනු ලැබීය. යුදෙව් සම්භවයක් පැවති රයිකන්බාක් වර්ෂ 1938 දී බර්ලින් විශ්වවිද්‍යාලයේ ඔහුගේ තනතුරින් ඉතා සතුටින් අස් වී ඉස්තාන්බුල් විශ්වවිද්‍යාලයට බැදුනේය. එසේනමුත් ඔහු අඛණ්ඩව සිය සගයන් සමග දාර්ශනික සංවාදයේ නිරත වුවේය. 1938 දී එක්සත් ජනපදයට සංක්‍රමණය වී කැලිෆෝනියා විශ්වවිද්‍යාලයට සම්බන්ධ වුයේ ය. වර්ෂ 1953 දී ඔහුගේ මරණය සිදුවිය. ප්‍රාග් නගරයට පලා ගිය ඩුබිස්ලාව් 1937 වර්ෂයේ දී සියදිවි හානි කරගත්තේය. ශ්ලික්, 1936 වර්ෂයේ දී ශිෂයෙකු විසින් ඝාතනය කරන ලදී.[50] ප්‍රතිපත්තිගරුක, මෘදු පුද්ගලයෙකු වූ ග්‍රෙලිං ඔහුගේ බිරිඳ සමග ම ඖෂ්විට්ස්[51] ගෑස් කාමරයට ගාල් කරනු ලැබීය. නියුරත් නෙදර්ලන්තයට පලා යාමට සමත් වූ අතර පසුව එංගලන්තයට ගොස් 1945 දී සිදු වූ මරණය දක්වා ම පර්යේෂණ කටයුතු වල නිරත වුයේය.

බර්ලිනයේ හා වියානාවේ අනෙකුත් අනුභූතිවාදී සාමාජිකයන් කානප්, ෆීගල්, ෆ්‍රැන්ක් , මෙන්ජර්, හා මම ී එක්සත් ජනපදයේ නව ජීවිත ආරම්භ කිරීමට තරම් වාසනාවන්ත

වුනෙමු. චාල්ස් මොරිස් හා ජෝන් ඩිවී ආදී උපයෝගීතාවාදී නැඹුරුවක් සහිත ඇමරිකානු අනුභවාදීන් සමග සමීපව සම්බන්ධ වුයෙමු.

දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු, විශේෂයෙන් ම කානප් විසින් ගොඩනගනු ලැබූ තාර්කික අනුභූතිවාදය, මියුනිට් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය වොල්ෆාංග් ස්ටෙග්මියුලර්[52] ඇතුලු වෙනත් බොහෝ විශ්වවිද්‍යාලවල සිටි කානප්ගේ ශිෂ්‍යයන් විසින් පුලුල් සංවාදයකට භාජනය කරන ලදි. 1939 වර්ෂයේ දී වසා දමනු ලැබූ 'දැනුම' සඟරාව ස්ටෙමියුලර් හා ඔහුගේ ශිෂ්‍ය ෆ්‍රැන්ක්ෆර්ට් විශ්වවිද්‍යාලයේ විල්ගෙල්ම් එස්ලර්[53] විසින් නැවත ආරම්භ කරන ලදි. 'නව දැනුම'සඟරාව 1975 දී ආරම්භ කර මේ දක්වා සාර්ථකව කාණ්ඩ 09 ක් ප්‍රකාශයට පත්කරන ලදී.

**සටහන්**

1) වර්ෂ 1991 දී පිහිටුවනු ලැබූ වියනා කවයේ ආයතනය (Institute Vienna Circle) විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ එහි ප්‍රථම සංවත්සර ග්‍රන්ථයට කාල් හෙම්පල් විසින් රචනා කරනු ලැබූ 'Empiricism in the Vienna Circle and in the Berlin Society for Scientific Philosophy: Recollection and Refelection' නම් ලිපියේ සිංහල පරිවර්තනය යි(සංවත්සර ග්‍රන්ථය ෆ්‍රෙඩික් ස්ටැග්ලර්ගේ සංස්කරණයෙන් වර්ෂ 1993 ප්‍රකාශයට පත් කෙරුනු අතර එම වර්ෂයේ දීම එය ක්ලුවර් ප්‍රකාශකයන් විසින් Scientific Philosophy: Origins and Development නමින් ප්‍රකාහයට පත්කරන ලදි.

මෙම ලිපිය වියනා කවය හා බර්ලින් සංගමයට අයත්ව සිටි සාමාජිකයන් පිළිබඳ මතක සටහන්, ඔවුන්ගේ චරිත පිළිබඳ විග්‍රහයන් මෙන් ම ඔවුන්ගේ දාර්ශනික අදහස් පිළිබඳ කෙටි විමර්ශනයන් ද අන්තර්ගත වේ. මේ නයින් ගත් කළ මෙම ලිපිය අර්ධ ශාස්ත්‍රීය සංග්‍රහයක් හා අර්ධ ඓතිහාසික විවරණයකි. විශේෂයෙන් ම එහි සමාපත්තියෙහි සඳහන් කරුණු අනුව එය නාට්‍යාකාරයක, ශෝකාන්ත නාට්‍යයක, ස්වරූපය ද පෙන්නුම් කරයි.

කාල් ගුස්ටාව් හෙම්පල් (1905-1997) ප්‍රකට විධික්‍රමවාදී දාර්ශනිකයෙකි; තර්ක ශාස්ත්‍රඥයෙකි. ඔහු දර්ශනය, ගණිතය හා භෞතික විද්‍යාව අධ්‍යයනය කළේය. එසේ ම ඔහු තාර්කික අනුභූතිවාදී ව්‍යාපාරයේ පුරෝගාමියෙකු විය. තාර්කික අනුභූතිවාදී ව්‍යාපාරයේ බොහෝ නායකයන් ඝාතනය කරුනු දෙවන ලෝක මහා සංග්‍රාමයට මතු කලකට පෙර තරුණ හෙම්පල් ජර්මනියෙන් පිට වුයේය. පළමුව බෙල්ජියමට පැමිණි ඔහු ඉක්මනින් ම එක්සත් ජනපදයට පළා ගොස් එහි ස්ථාවර වුයේය. යේල් හා පීටස්බර්ග් ඇතුලු ඇමරිකානු විශ්වවිද්‍යාල ගනනාවක ඉගැන්වීම් කල ඔහු 'දැනුම' නව සඟරාවේ සංස්කාරක විය. ජීවිතයේ වැඩිහිටි සමයේ දී ඔහු තාර්කික අනුභූතිවාදය අත්හළේය.

2) Moritz Schlick
3) Die Wende der Philosophie
4) Erkenntnis
5) Otto Neurath and Carnap
6) Der Logische Aufbau der Welt
7) Bauhaus
8) Chicago school of Design
9) Feigl
10) L. Moholy- Nagy
11) Hans Reichenbach
12) Einstein and Max Plank
13) Fakultãt für Physik
14) Götingen and Heidelberg
15) Causality and Determinism
16) Critique of Pure Reason
17) Paul Bernays, Wolfgang köhler, Kurt Lewin
18) Die Gesellschaft für Empirische Philosophie
19) Technische Hochschule
20) Impredicable Paradox
21) Walter dubislav, Alexander Herzberg, Kurt Grelling
22) Tarski
23) Hanussen
24) logical Atomism
25) Heinrich Scholz

26) Kiel

27) Verein Ernest mach

28) Die Wende der Philosophie

29) Erwin F. Freundlich

30) Die Überwindung der Metaphysik durch Logiche Analyse der sprache

31) Tagung Fur die Erkenntnisletire der Exakten Wissenschaften

32) Hans Hahn, Herbert feigl

33) Karl Menger, Felix Kaufmann, Philip Frank

34) Karl Popper

35) David Hilbert, Sigmend freud, Felix Klein, Jacques Loeb

36) Aufrut

37) පෙර නැගෙනහිර බර්ලිනයේ ‘ශාස්ත්‍රීය විද්‍යා පිළිබඳ මධ්‍යම ලේඛනාගාරයෙහි’(Zentrales Archiv der Akademic der Wissenschaften) තැන්පත් කර තිබෙන මෙම ලේඛනය ගැන මට දැනුම් දුන් පීටස්බර්ග් විශ්විද්‍යාලයේ මහාචාර්ය ඇඩොල්ෆ් ගෲන්බවුම් (Adolf Grunbaum) එහි පිටපතක් ද මා වෙත ලබා දුන්නේ ය. මේ පිලිබඳ විස්තරාත්මක විවරණයක් ‘දර්ශනය, මනෝවිද්‍යාව හා විද්‍යාත්මක ක්‍රමය’ වාරසඟරාවේ (vol 1x, no.15, July 18 1912 pp. 419-420) පල විය. (කාල් හෙම්පල්ගේ සහනකි පරි.)

38) Society for Positivist Philosophy

39) සියලු චිත්තවේග, මනෝභාව පමණක් නොව පෞරුෂය හා චර්යාවන් පවා මොළය විසින් පාලනය කරනු ලබන බව පවසන්නේ කායික වාදය යි.(Physicalism). ගිල්බට් රයිල් 1940 දශකයේ දී මෙය විධිමත් මතවාදයක් ලෙස ගොඩනැගූ අතර 1960 දශකයේ දී ඩී. එම්. අම්ස්ට්‍රෝන්ගේ කායිකවාදී චර්යාවාදයක් (Physical Behaviourism) බවට පත්කළේය. එහෙත් 1980 දශකයේ දී ද ඩේවිඩ් ලෙවිස් පිරිසිදු කායිකවාදය ආරක්ෂා කර ගැනීමට උත්සහ කළේය.

40) The Concept of Mind – Gilbert Ryle.

41) Waismann

42) Ballungen

43) Tautology

44) C. S. Peirce, William James, John Dewey, Ernest Nagel.

45) How we think, not: RAtional Thinking.

46) Thomas Kuhn

47) ‘Two Dogmas of Empiricism’ and ‘Word and Object’ – W. V. Quine.

48) Monolithic System

49) හිට්ලර්ගේ නාසි පොලීසිය

50) මෙම ශිෂ්‍යයා මානසික රෝගියෙකු වශයෙන් ෂලකා අධිකරණයෙන් නිදහස් කරනු ලැබූ අතර ඔහු ඇත්ත වශයෙන් ම හිට්ලර්ගේ රහස් පොලිස් ඔත්තු කරුවෙකු බව පසුව හෙළිදරව් විය.

51) Auschwitz- යුදෙව්වන් ලක්‍ෂ ගනනින් ඝාතනය කළ ගෑස් කාමර හා මල සිරුරු දවා හලු කළ උදුන් පැවති කුප්‍රකට සිරගෙවල් සංකීර්ණය.

52) Wotgang Stegmiiler

53) Wilhelm Essler

54) සමාප්ති සටහන: තාර්කික අනුභූති වාදය විනාශ කර දැමීමේ කිසියම් අභිප්‍රායක් හිට්ලර් වෙත පැවතීද? එය එසේ නම්, තාර්කික අනුභූතිවාදය වැනි ඉහළ තාක්‍ෂණික දර්ශන සම්ප්‍රදායක් විනාශ කිරීමේ හිට්ලර්ගේ අභිප්‍රාය කවරක් ද? මෙය ඉතිහාඥයන් විසින් මෙතෙක් අවධානය යොමු නොකෙරුනු අර්ධ ඓතිහාසික හා අර්ධ දාර්ශනික ගැටලුවකි. මතුපිටින් ගත්කළ කෙනෙකුට පෙනී යන්නේ ලක්‍ෂ සංඛ්‍යාත යුදෙව්වන් සංහාරය කිරීමේ දී තාර්කික අනුභූතිවාදී ව්‍යාපාරයේ යුදෙව්වන් ද විනාශ වු බවයි. මෙහිදී පැන නගින තවත් ප්‍රශ්නයක් නම් තාර්කික යථානුභූතිවාදී ව්‍යාපාරයේ සාමාජිකයන් වැඩි සංඛ්‍යාවක් යුදෙව්වන් වුයේ ඇයි යන්නයි.

තාර්කික අනුභූතිවාදයේ අරමුණ, ලෝක චිත්‍රයට කිසියම් ඒකීය හා ඒකදිශානතික ජ්‍යාමිතික හැඩතලයක් ලබා දීම බව ඉතා පැහැදිලිය. ඒ බව හෙම්පල්ගේ මෙම ලිපියෙන් ද ප්‍රකට වෙයි. මෙය යුදෙව් චින්තනයේ මුලධර්මයකි. හිට්ලර් විරුද්ධ වුයේ මෙම යුදෙව් මූලධර්මයට ද? පිලිප් ෆ්‍රැන්ක් මෑත කාලයේ දී ඉඟි කළ ආකාරයට හිට්ලර් මෙම යුදෙව් මුලධර්මයට විරුද්ධ වුයේ ඔහු තමන් ආර්ය වර්ගිකයෙකු වශයෙන් සැලකිම හේතුවෙන් ද?

කාල්. ජී. හෙම්පල්

පරිවර්තනය : ගාමිණී හපුආරච්චි